# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2418/42 - 2025 ජනවාරි මස 10 වැනි සිකුරාදා 2025.01.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සුරාබදු ආඥාපනත**

අංක 01/2025 දරන සුරාබදු නිවේදනය

**මත්පැන් සඳහා වූ සුරාබද්ද**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, 2025 ජනවාරි මස 11 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි;

(1) ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද බලපත්‍රලත් යම් නිෂ්පාදනාගාරයක නිපදවනු ලැබ ඉන් නිකුත් කරනු ලබන්නා වූ විශේෂ අරක්කු මත්පැන් මධ්‍යසාර සෑම ලීටරයකට ම රුපියල් හත්දහස් දෙසිය හතළිස් හතරක් (රු. 7,244.00) වන බද්දක් අය විය යුතු යැයි ද;

(2) ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද බලපත්‍රලත් යම් නිෂ්පාදනාගාරයක නිපදවනු ලැබ ඉන් නිකුත් කරනු ලබන්නා වූ ඉක්ෂුපාක, තල්, පොල් සහ පදම් කළ අරක්කු මත්පැන් මධ්‍යසාර සෑම ලීටරයකට ම රුපියල් හත්දහස් හත්සිය පනස් දෙකක් (රු. 7,752.00) වන බද්දක් අය විය යුතු යැයි ද;

(3) ශ්‍රී ලංකාව තුළ නිපදවනු ලබන මෙරට සෑදූ "විදේශීය" ස්ප්‍රිතු මත්පැන් මධ්‍යසාර සෑම ලීටරයකට ම රුපියල් හත්දහස් නවසිය හැට නවයක් (රු. 7,969.00) වන බද්දක් අය විය යුතු යැයි ද;

(4) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති යම් බලයලත් නිෂ්පාදනාගාරයක නිෂ්පාදනය කොට නිකුත් කරනු ලබන ධාන්‍ය මත්පැන්, ලේබලයේ සඳහන් නිරපේක්ෂ සැර සියයට පහක් (5%) සහ ඊට අඩු වන්නේ නම් එසේ නිකුත් කරනු ලබන/නිෂ්පාදනය කරනු ලබන සෑම ලීටරයක ම රුපියල් පන්දහස් හත්සිය තිස්පහක් (රු. 5,735.00) වන බද්දක් අය විය යුතු යැයි ද;

(5) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති යම් බලයලත් නිෂ්පාදනාගාරයක නිෂ්පාදනය කොට නිකුත් කරනු ලබන ධාන්‍ය මත්පැන්, ලේබලයේ සඳහන් නිරපේක්ෂ සැර සියයට පහකට (5%) වඩා වැඩි වන්නේ නම් එසේ නිකුත් කරනු ලබන/නිෂ්පාදනය කරනු ලබන සෑම ලීටරයකට ම රුපියල් හයදහස් පහළොවක් (රු. 6,015.00) වන බද්දක් අය විය යුතු යැයි ද;

(6) රා හෝ වෙනත් කිසියම් ධාන්‍ය වර්ගයකින් සෑදූ මත්පැන් හැරුණු කොට තාල වර්ගයේ ගසකින් හෝ වෙනත් ඕනෑම පැළෑටියකින් ලබා ගන්නා ස්වාභාවික නිෂ්පාදන ආසවනය කිරීමෙන් බැහැර ක්‍රියාවලියක් තුළින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන්නා වූ මත්පැන් මධ්‍යසාර සෑම ලීටරයක ම රුපියල් පන්දහස් හත්සිය තිස්පහක් (රු. 5,735.00) වන බද්දක් අය විය යුතු යැයි ද;


1A - PG 6993 - 454 (2025/01)



*සැ.යු.- මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(7) මධ්‍යසාර ප්‍රතිශතය සියයට දහ අටට (18%) අඩු දේශීය ශාක ද්‍රව්‍ය හෝ ශාක නිෂ්පාදන හෝ දේශීය පානීය සත්ත්ව කිරි මගින් හෝ පමණක් ආසවනය කිරීමෙන් බැහැර ක්‍රියාවලියක් තුළින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන්නා වූ මත්පැන් සඳහා මධ්‍යසාර සෑම ලීටරයක ම රුපියල් එක්දහස් පන්සිය හැට හතක් (රු. 1,567.00) වන බද්දක් අය විය යුතු යැයි ද;

(8) ශ්‍රී ලංකාව තුළ නිපදවනු ලබන මෙටර සෑදූ කිරි පොන්සා මත්පැන් මධ්‍යසාර සෑම ලීටරයක ම රුපියල් තුන්දහස් නවසිය අසූ දෙකක් (රු. 3,982.00) වන බද්දක් අය විය යුතු යැයි ද;

(9) ශ්‍රී ලංකාව තුළ නිපදවනු ලබන මෙරට සෑදූ සයිඩර්, ලේබලයේ සඳහන් නිරපේක්ෂ සැර සියයට හතරකට (4%) නොවැඩි මත්පැන් මධ්‍යසාර සෑම ලීටරයක ම රුපියල් හාරදහස් තුන්සිය හතළිස් හතක් (රු. 4,347.00) වන බද්දක් අය විය යුතු යැයි ද;

(10) ඉහත (1) සිට (9) දක්වා නිශ්චිත සඳහන් කර ඇති බද්ද, අපනයනය කරනු ලබන මත්පැන් කවර ප්‍රමාණයක් සම්බන්ධයෙන් වුවද එකී බද්ද අය නොකළ යුතු යැයි ද;

(11) ඉහත අයිතම (4) සහ (5) යටතේ නිශ්චිතව සඳහන් කර ඇති බද්ද, යම් විදේශීය රටක් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ සිටින යම් තානාපති දූත මණ්ඩලයකට ප්‍රයෝජනය සඳහා නිෂ්පාදනාගාරයෙන් නිකුත් කරන ලද මත්පැන් ඕනෑම ප්‍රමාණයක් සඳහා කළ යුතු ගෙවීම් ඒ තානාපති දූත මණ්ඩලයේ විදේශීය ගිණුම්වලින් කරනු ලැබේ නම් ඒ මත්පැන් ප්‍රමාණය වෙනුවෙන් ඉහත කී බද්ද අය නොකළ යුතු යැයි ද;

2023 දෙසැම්බර් මස 31 දිනැති අංක 2364/35 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලැබූ අංක 04/2023 දරන සුරාබදු නිවේදනය මෙයින් අවලංගු විය යුතු යැයි ද, නියම කරමි.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2025 ක් වූ ජනවාරි මස 10 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

EOG 01-0110

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.